www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2008 බිඳවැටීම හා එහි විප්ලවවාදී ඇඟවුම්

*4 කොටස*

**The crash of 2008 and its revolutionary implications – Part 4**

**නික් බීම්ස් විසිනි**
**2009 පෙබරවාරි 7**

*පහත පලවන්නේ ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සාමාජිකයෙකු වන නික් බීම්ස් විසින් 2009 ජනවාරි මාසයේ පවත්වන ලද සසප ගිම්හාන පාසැලට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සිවු වන හෙවත් අවසාන කොටසයි.*

ජාත්‍යන්තර සමාජවාදී විප්ලවයෙන් මෙහා කිසිම දෙයකට, ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ අර්බුදය ජය ගත නොහැකි බව ද, මනුෂ්‍ය වර්ගයා ව්‍යසනයකට ඇදවැටීමෙන් වලක්වාගත හැකි එකම ක්‍රමය එය බව ද, වත්මන් තත්වයේ මූලාරම්භය පිලිබඳ අපගේ තක්සේරුව තුලින් ගලා එන නිගමනයයි. කම්කරු පන්තියේ දේශපාලන විඥ්ඥානය නංවාලීමෙහි ලා අප ගෙන යන අරගලයේ දී මෙම සංකල්පය තීරනාත්මක ය.

ධනේශ්වරය ව්‍යසනකාරී දෘෂ්ටිමය බිඳ වැටීමකට මුහුනපා සිටියි. පසුගිය දශක තුන පුරා කම්කරු පන්තියට එල්ල කල ප්‍රහාරයන්හි දී ඔවුන් පදනම්ව සිටි "නිදහස් වෙලඳපොල" දෘෂ්ටිවාදය කුඩු පට්ටම්ව ගොසිනි. ඊට සමාන්තරව, මේ අර්බුදයට ධනවාදයේ සැකිල්ල තුලම විසඳුමක් පවතින්නේය යන මිථ්‍යාව වගා කිරීමේ මංමුලා සහගත උත්සාහය අප දැක තිබේ. මෙම ව්‍යායාමයේදී විවිධ කේනීසියානුවන්, "වාමාංශය" හා ඊනියා මාක්ස්වාදී අර්ථශාස්ත්‍රඥයන් පවා මෙහෙයවා ගෙන ඇත. ඉනුත් එහාට ගිය විට ධනේශ්වරය, විවිධ රැඩිකල් කන්ඩායම් අතුරින් අලුත් මුක්කුකරුවන් සොයාගැනීමේ උත්සාහයක ද නිරතව සිටියි.

ආර්ථික පෙරමුනේ දී, මැසෙචුසෙට්ස් සරසවිය පදනම් කර ගත් දේශපාලන ආර්ථික විද්‍යා ආයතනයේ හා නව ගුරු කුලයේ ආර්ථික විශ්ලේෂනය පිලිබඳ ෂ්වෝස් මධ්‍යස්ථානයෙහි අනුශාසනා මධ්‍යයේ, ජනවාරි 1 දින "වාම" අර්ථශාස්ත්‍රඥයන් 20 කගේ පමන අත්සනින් නිකුත්කල ප්‍රකාශය, සංකේතාත්මක ය.

ආර්ථික තුලනායතන ලිහා හරිමින්, සමස්ත ආර්ථිකය තුලට ම ඇතුල්වී තිබෙන, මූල්‍ය වෙලඳපොලවලින් මුදාහල එකට බැඳුනු හා යටි නැඹුරුවක් සහිත පීඩනයන් මාලාවක් සමඟ, අද දිනයේ දක්නට ලැබෙන ආකාරයේ ආර්ථික අර්බුදයකට, මහා අවපාතයෙන් පසුව ලෝකය මුහුනපා නැතැයි යන අනතුරු ඇඟවීමෙන් ප්‍රකාශය ආරම්භ වෙයි.

ඔබාමා පරිපාලනය, අනෙකුත් ජාතික ආන්ඩු හා ජාත්‍යන්තර මූල්‍යායතන විසින් ගන්නා කඩිනම් හා සම්බන්ධීකාරක ක්‍රියාමාර්ගයකින් මෙම අර්බුද වලක්වාගත හැකි වනු ඇත. එසේ වන්නේ මෙම පියවර, අසාර්ථකවූ ආයතන හා අර්බුදය නිර්මානය කිරීමට දායකවූ අතීත භාවිතාවන් ආරක්ෂා කිරීමට නොව, කෙලින්ම ජනතාවගේ හා ජන කොටස්වල අවශ්‍යතාවන්හි සේවය සඳහා යොමු කරන්නේ නම් පමනි.

මෙම "වම්මුන්" ඔබාමා යම් වර්ගයක රූස්වෙල්ට් කෙනෙකු ලෙස හුවා දැක්වීමට මනාපය දක්වයි. එහෙත් පසුගිය 75 වසර තුල ඇමරිකානු ධනවාදයේ සමස්ත තත්වය, ඉමහත් වෙනස්කම්වලට භාජනය වී තිබේ. 1933 දී රූස්වෙල්ට් බලයට පත්වන විට ඇමරිකාව පැවතුනේ තවමත් නැඟී එන ආර්ථික බලයක් ලෙස ය. තවදුරටත් එසේ නොවේ. දැන් එය ලෝකයේ වඩාත්ම නයගැති රාජ්‍යයයි. බොහෝකොට ම ව්‍යාපාරිකයේ වාසිය සඳහා වියදම් ඉහල නැංවීමට ඔබාමා පිලින දී ඇතත්, ඇමරිකානු නයගැතිකම පුපුරායාමට තර්ජනය කරන තතු හමුවේ, සමාජ ආරක්ෂන පහසුකම් තර්ජනයට ලක්වනු ඇතැයි ඔහු පැහැදිලිව පෙන්නුම්කර තිබේ.

ඉහත කී ආකාරයේ තවත් ප්‍රකාශයක් පසුගිය සැප්තැම්බරයේදී, විකල්ප ආර්ථික ප්‍රතිපත්තියක් සඳහා වන යුරෝපීය අර්ථශාස්ත්‍රඥයෝ නමින් තමන්ව හඳුන්වාගන්නා කන්ඩායමක් විසින් ද, නිකුත්කොට තිබේ. සිය ඇමරිකානු හවුල්කරුවන් මෙන්ම ඔවුන් ද, තම ප්‍රතිපත්ති වට්ටෝරුව, 1930 ගනන්වල අවපාතය අවධියේ කේන්ස් විසින් ඉදිරිපත් කල විශ්ලේෂනය මත පදනම් කරති.

"යුරෝපය තුල මූල්‍ය අර්බුදය හා එල්බ තිබෙන පසුබෑමට මුහුන දීම සඳහා විකල්ප ආර්ථික ප්‍රතිපත්තියක් පිලිබඳ අපගේ යෝජනාවන් ද පටන් ගන්නේ, 'පරපුටුභාවයේ මරනය පහසුකිරීම' දිරිගැන්විය යුතු, පොදු ප්‍රතිපත්තියක් පිලිබඳ ජෝන් මේනාඩ් කේන්ස්ගේ මතියෙනි. විකල්ප වාතාවරනයක් තුල, නය

යොදාගත යුත්තේ කෙටිකාලීන මූල්‍ය වාසි සඳහා නොව, පූර්න සේවා නියුක්තිය සඳහාත්, දුප්පත්කමට හා පරත්වාරෝපනයට එරෙහි සටනේ දායකත්වය ඉහල නැංවෙන පරිදි, නිෂ්පාදනයේ ආයෝජන දිරිගැන්වීමටත් ය.”

මෙම අර්ථශාස්ත්‍රඥයෝ ප්‍රතිසංස්කරන මාලාවක් ගෙනහැර දක්වති. විශ්‍රාම අරමුදල් පුද්ගලීකරනය අවසන් කිරීම, මූල්‍යායතන මත ප්‍රජාතන්ත්‍රවාදී පාලනය දැඩි කිරීම හා ඉමහත් සමාජ අසමානතාවය වේගවත් කරන ලද ව්‍යාපාරයේ, මූල්‍ය හුරු පුරුදු අවසන් කිරීම ඊට ඇතුලත් ය. පූර්න සේවා නියුක්තිය හා සමාජ බැඳීම් ශක්තිමත් කිරීම වෙනුවෙන් කැපවූ ප්‍රතිපත්ති, “මූල්‍ය ක්ෂේත්‍රය අකර්මන්‍ය කර මූල්‍යය, නව ආකෘතියේ අත්‍යවශ්‍ය හා වැදගත් අංගයක් බවට පරිවර්තනය කරනු ඇත. මේ මඟින් ධනවාදය නොව, මූල්‍යය මඟින් දුවවන ධනවාදය අවසානයකට ගෙන එනු ඇත.”

මෙම ප්‍රතිසංස්කරනවාදී ව්‍යාපෘතියේ මූලික දෝෂය වන්නේ, පසුගිය දශක තුන පුරා මූල්‍ය ක්ෂේත්‍රයේ ඇතිවූ ඉමහත් ප්‍රසාරනය, කෙසේ හෝ අවාසනාවන්ත ලෙස සමස්ත ආර්ථිකය මත නැඟී ආ පරපුටු ක්‍රියාවලියක්සේ සංකල්පනය කිරීම මත පිහිටුවා ලීමයි. එසේ නොවූයේ නම් සමස්ත ආර්ථිකය ශක්තිමත්ව පැවතියේය. නිෂ්පාදන ආර්ථික ක්‍රියාවලියට ආධාරකයක් ලෙස ක්‍රියාකිරීමට නියමිත යයි සලකන ලද මූල්‍යය, ලිහිල් රෙගුලාසි හා නව ලිබරල් දෘෂ්ටිවාදය හේතුවෙන් පාලනය කර ගත හොහැකිවූ අතර, දැන් එය පාලනයක් යටතට ගෙන ආ යුතු බව එහි අර්ථයයි.

මේ මඟින් පසුගිය 30 වසර පුරා ලෝක ධනවාදය තුල සිදුවූ ඉමහත් ව්‍යුහාත්මක වෙනස්කම් නොසලකා හැරේ. 1980 ගනන් මුල් භාගයේ එක්සත් ජනපද මූල්‍ය ක්ෂේත්‍රය, ව්‍යාපාරික ලාභයෙන් සියයට 5-10 අතර ප්‍රමානයක් හිමිකර ගත්තේය. 2006 දී මෙම පංගුව සියයට 40 විය. මෙය එක්සත් ජනපද ආර්ථිකයේ ගුනාත්මක පරිවර්තනයකි. එය වර්ධනය වූයේ ද, 1970 ගනන් අග භාගයේ ලාභ සමුච්චය ක්‍රියාවලියෙහි හටගත් අර්බුදයට ප්‍රතිචාර වශයෙනි. සමුච්චයේ නව මාදිලීන් පදනම්ව තිබුනේ, නයෙහි දැවැන්ත ප්‍රසාරනය මඟින් දහනය කල මූල්‍ය මෙහෙයුම් මත ය. දල දේශීය නිෂ්පාදිතයේ (දදේනි) ප්‍රතිශතයක් ලෙස, එක්සත් ජනපද නය තටාකය 1980 පැවති සියයට 163 සිට 2007 වසරේදී සියයට 346 දක්වා ඉහල ගියේය. කුටුම්භයන්ගේ නය, 1980 දදේනි න් සියයට 50 ක සිට 2007 දී සියයට 100 දක්වා වැඩි විය.

කෙසේ වුව ද මෙම අති වේගවත් නැගීම ඇතිවූයේ, මූල්‍ය ක්ෂේත්‍රයේ ය. දදේනි ප්‍රතිශතයක් ලෙස එම ක්ෂේත්‍රයේ නය, 1980 දී සියයට 21 ක සිට 2000 දී 83 දක්වා හා 2007 දී සියයට 116 නැගුනි.

මෙම සංඛ්‍යාවන් පෙන්නුම් කරන්නේ, ලාභ රාශීකරනයේදී මෙන්ම සමස්ත ක්‍රියාදාමය තුල නය නිර්මානයේදී ද, මූලය ක්ෂේත්‍රය ඉටුකල තීරනාත්මක ක්‍රියාකලාපයයි. විශේෂයෙන්ම පරපුටු (ව්‍යුත්පන්න) මූල්‍ය මෙවලම්වල නව පරාසයක්ම බිහිකොට තිබෙන, රාශීකරන මාදිලිය තුල සිදුවූ මෙම පරිවර්තනය, එක්සත් ජනපදයට පමනක් සීමා නොවීය. නිදසුනක් ලෙස බ්‍රිතාන්‍ය තුල, 1984 පටන් මූල්‍ය ක්ෂේත්‍රයේ සේවා නියුක්තිය සියයට 22 කින් වැඩිවී ඇතැයි ගනන් බලා තිබේ. බ්‍රිතාන්‍යයේ පලාත් පාලන ආයතන 30 ක ජීවත් වන කම්කරුවන්ගෙන් සියයට 25 ක් රැකියා කරන්නේ ව්‍යාපාර හා මූල්‍ය සේවාවන්හි ය. බ්‍රිතාන්‍යයේ කලාප 11 න් 9 ක් තුලම, අඩුම තරමින් එක් පලාත් පාලන ආයතනයක වැසියන්ගෙන් සියයට 20 ක්, ව්‍යාපාර හා මූලය සේවාවන්හි රැකියා කරති.

2003 වසරේ ප්‍රකාශයට පත්කල අධ්‍යයනයක තොරතුරු වලට අනුව, ආර්ථික සහයෝගිතාව හා සංවර්ධන සංවිධානයට (ඕඊසීඩී) අයත් රටවල, මූල්‍ය ක්ෂේත්‍රයට ගලායන ආදායමේ එනම් පරපුටු ආදායමේ පංගුව “නාටකාකාර ලෙස ඉහල නැග” තිබේ. 1960 හා 70 ගනන්වල සිට 1980 හා 90 ගනන් වන විට එක්සත් ජනපදයේදී එය සියයට 92 න් ද, එක්සත් රාජධනානියේ සියයට 143 න් හා දකුනු කොරියාවේ සියයට 155 න් ද ඉහල ගියේය.

නොඑසේ නම් නිරෝගී ස්කන්ධයක්ව පැවතුන ධනේශ්වර ආර්ථිකය මත, කෙසේ හෝ පිලිලයක් සේ වැඩී යාමට වඩා, මූල්‍යයේ වර්ධනය සලකුනු කරන්නේ, නිෂ්පාදන මාදිලියට ආවේනික සියලු පරස්පර විරෝධයන් මතුවී ඒමක් ලෙසය. ප්‍රාග්ධනයේ පරිපථය වනාහි මුදලට මුදල ය. (M to M') මුදලේ ආරම්භක යෙදවුම වන M ආපසු පැමිනෙන්නේ ඊට එකතුකල වටිනාකමක් ද සමඟ M' ලෙස ය. එනම් ආරම්භක ලක්ෂය වන මුදල් - ප්‍රාග්ධනය, සමස්ත ක්‍රියාවලියේ ආපසු පැමිනීමේ ලක්ෂය ද වේ.

වටිනාකමේ මුදල්මය රූපය, එහි ස්වාධීන හා ස්පර්ෂ කල හැකි රූපයෙන් හරියට ම සංසරනයේදී ගන්නා රූපය M…M' ය. එනම් වඩාත් ස්පර්ෂ කල හැකි සැබෑ මුදලත් සමග පටන් ගන්නා හා අවසන් වන සංසරනයේ දී (M,,,,M') මුදල......එකතුකල අගය සහිත මුදල, වන බැවින්, ධනේශ්වර නිෂ්පාදනයේ ගාමක අභිප්‍රේරනය, මුදල් ඉපැයීම ලෙසින් ප්‍රකාශයට පත්වෙයි. නිෂ්පාදන ක්‍රියාවලිය දිස් වන්නේ මුදල් ඉපැයීමේ අරමුන සඳහා අත්‍යවශ්‍ය වන, හුදෙක් මඟ නොහැරිය හැකි අතර මැද දෙයක් ලෙසය. ( *Capital,* මාක්ස්, කැපිටාල් වෙලුම 2, පි. 137)

වෙනත් වචනවලින් කිවහොත්, මූල්‍යය, සැබෑ නිෂ්පාදනයට අනුෂාංගික වන දෙයක් නොවේ. මාක්ස් පෙන්නුම් කල පරිදි “නිෂ්පාදනය, වටිනාකම වැඩි

කිරීමේ දී කෘතීම ලෙස මිල නැංවීම සඳහා යොදාගන්නා හුදු මාධ්‍යයන් පමනක් වන්නේ”ය.

සමස්තයක් ලෙසම ධනේශ්වර පද්ධතියේ ඓතිහාසික අර්බුදය, මූල්‍ය අර්බුදයක් පරිදි දිස්වන්නේ එබැවින් ය. මූල්‍යකරනයේ එම ක්‍රියාවලියම, ධනේශ්වර නිෂ්පාදන මාදිලිය, ආතතියේ නව මුදුනකට ඔසවා තබන බැවිනි.

ලෝක ජනගහනයේ සියලු කොටස්, ප්‍රාග්ධනයේ ගෝලීය පරිපථයක් තුලට ඒකාග්‍ර කර ඇති සමුච්ඡයේ ක්‍රියාවලියක වර්ධනයෙන්, මූල්‍යයේ නැගී ඒමට වෙන්වී ගත නෙහැකිය.

20 වන සියවසෙහි මුල් දශකය තුල, රෝසා ලක්සම්බර්ග්ට සිදුවූ අතපසුවීමක් නිසා, අධිරාජ්‍යවාදී බලවතුන් විසින් ලෝකයේ සියලු ධනවාදී නොවන කලාපයන් එකට බැඳ දැමූ බැවින්, ධනවාදය බිඳවැටෙනු ඇතැයි සැලකුවාය.

ඇයගේ සුවශේෂී තක්සේරුව වැරදි වූ නමුත්, ලෝකයේ අඩු දියුනු කලාපයන්හි තීරනාත්මක ක්‍රියාකලාපය මත ඇය යෙදූ අවධාරනය, සැබවින්ම ඉතිහාසය විසින් සනාථ කර තිබේ.

චීනය ඉන්දියාව හා අනෙකුත් කලාපයන්හි ලාභ ශ්‍රමය, ගෝලීය පරිපථයක් තුලට ඒකාබද්ධ කිරීම මඟින් ප්‍රාග්ධනය, සමුච්චයකරනයේ අවසන් අර්බුදය ජය ගැනීමට සමත් විය. එහෙත් එසේ කිරීමේ දී එය තම මූලික ප්‍රතිවිරෝධයන් විසඳගත්තේ නැත. ඒ වෙනුවට එය ඊටත් වඩා පුපුරන සුලු රූපයකින් ඒවායේ නැගී ඒම සඳහා කොන්දේසි නිර්මානය කලේය. ලාභානුපාතිකය වැටීමේ ප්‍රවනතාවය, චීනය හා අනෙක් තැන්වල සුපිරි ශ්‍රම සූරාකෑම තුලින් මෙන්ම, 30 වසරක කාලයක් පුරා දියුනු රටවල කම්කරු පන්තියේ තත්වයන් කප්පාදු කිරීම මඟින්, යම් කාල පරිච්ඡේදයකට හරස් කරනු ලැබිනි.

කෙසේ වුව ද මෙම ක්‍රියාවලිය අනෙක් අතට, සමුච්ඡිත අතිරික්ත වටිනාකම මත සිය හිමිකම ඉදිරිපත් කල දැවැන්ත ව්‍යාජ ප්‍රාග්ධන සමුදායක් නිර්මානය කලේය. මෙම හිමිකම් ලබාදෙන්නේ කෙසේ ද? ධනවාදයේ නහරවලට අලුත් ලේ පොම්ප කිරීම සඳහා තවත් චීනයක් පොරොත්තු ලේඛනයේ රැඳී නැත. එසේ තිබුනත්, දියුනු ධනේශ්වර රටවලට වඩා තිස් ගුනයකින් අඩු මිලකට ශ්‍රමය සූරාකෑමෙන් අත් කරගත් ජීවය, පුනර්කරනය කල නොහැකිය.

ප්‍රාග්ධනයේ සියලු අංශ, පසුබෑම් හා කඩා වැටීම් මඟින් ද, වෙලඳ යුද්ධ මඟින් හා අවශ්‍යනම් යාන්ත්‍රික ලෙස යුද්ධය මඟින්ම වනසා දැමිය යුතු ය. එකිනෙකා සියල්ලන්ට එරෙහි යුද්ධයේ දී, "තම තමන්ගේ" ධනපති පන්තියට සහයෝගය දීම සඳහා ලොව පුරාම සිටින වම්මුන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකිරීමට නියමිතය.

දෘෂ්ටිමය සූදානම් කිරීම් දැනටමත් සිදුව තිබේ. නේෂන් පත්‍රයේ අලුත්ම කලාපයෙහි ඇතුලත් වන විලියම් ග්‍රේඩර්ගේ ලිපියක මෙසේ සඳහන් කරයි. "එක් ජාතියක් විසින් පමනක් ගෙන එන උත්තේජක ප්‍රතිපත්තියක් පල නොදරනු ඇත. මක්නිසාද යත් 'පුනර්ජීවයකට ඇති වඩාත්ම සංකීර්න බාධකය වන්නේ භූගෝලීයකරනය හා ආර්ථිකය මත ඉන් ඇතිකරන නිශේධනීය බලපෑම නිසාය.' ඔබාමාගේ උත්තේජක වැඩ පිලිවෙල චීනයේ කම්හල් යලි පන ගන්වනවා විය හැකිය, එහෙත් එක්සත් ජනපදයේ විරැකියාව ඉහලින් පවතිනු ඇතැයි'' ඔහු තවදුරටත් ලියා තැබීය.

පිලිතුර කුමක් ද? ගෝලීය උත්තේජක වැඩ පිලිවෙලකි. එහෙත් අනෙකුත් බලවතුන් එකඟ නොවුවහොත් කුමක් වන්නේ ද? "එක්සත් ජනපදයට එක් වැදගත් කොන්දේසියක් සහිතව යෝජනා ඉදිරිපත් කල හැකිය: වෙලඳ සහකරුවන් ඒකාබද්ධව ක්‍රියාකිරීමට අකමැති නම් වොෂින්ටනය ඒකපාර්ශිකව ඉදිරියට යා යුතුය."

ජෝර්ජ් ඩබ් බුෂ් පිලිබඳව "වම්මුන්ගේ" බොහෝ විවේචන තිබියදී ම එවන් වැඩ පිලිවෙලකට කුමක් බැදී තිබිය හැකි ද? අන්තර් ජාතික සංගත, එකතුකල වටිනාකම් සහිත සිය නිෂ්පාදන වලින් වැඩි කොටස, රට තුලම අලෙවිකිරීමට පොලඹවන ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් සමඟ, දන්ඩන බදු, "අවශ්‍ය නම් ආනයන මත ඇබයක් ගසන පොදු තීරු බදු මඟින් ද, බදු සංග්‍රහයන් මඟින් ද බලගැන්විය යුතුය." ආපසු ගිනි මැලය වෙත, එනම් ආපසු "අසල්වැසියා හිඟමනට දමනු" පිලිවෙත කරා යා යුතුය.

ධනවාදයේ බිඳ වැටීම, ගෝලීය මූල්‍ය අර්බුදයක රූපයෙන් පැන නැඟීම අහඹුවක් නොවේ. මක්නිසාද යත්, මාක්ස් පැහැදිලි කල පරිදි, ධනවාදය සෑම විටම එහි වර්ධනයට එල්ල වූ බාධකයන් ජය ගත්තේ නය පද්ධතියක මාර්ගයෙන් වීම නිසාය. එබැවින් නය, නිෂ්පාදන බලවේගයන්හි ද්‍රව්‍යමය සංවර්ධනය වේගවත් කර, ලෝක වෙලඳපොල නිර්මානය කරයි. ධනේශ්වර නිෂ්පාදන මාදිලියේ ඓතිහාසික කර්තව්‍යය වන්නේ සංවර්ධනයේ නිශ්චිත මට්ටමක් කරා එනම්, නිෂ්පාදනයේ නව ආකෘතියක් සඳහා භෞතික පදනම බවට එය පත්කරලීම ය. ඒ සමඟ ම නය, එම ප්‍රතිවිරෝධය හා අර්බුද ප්‍රචන්ඩ ආකාරයට පුපුරා යාම වේගවත් කරයි. පැරනි නිෂ්පාදන මාදිලිය අහෝසිකර දමන මූල ද්‍රව්‍යයන් වන්නේ මේවාය.

"නය පද්ධතියට ආවේනිකවූ ද්විත්ව ස්වභාවයක් පවතියි: එක් අතකින් එය ධනේශ්වර නිෂ්පාදනය සඳහා එනම්, අනෙකුන්ගේ ශ්‍රමය සූරාකෑම මඟින් ධනවත් වීම සඳහා අභිප්‍රේරනය ඉහල නංවන්නේ, දැනටමත් කුඩා සංඛ්‍යාවක් වන සමාජ ධනය සූරාකන්නවුන් තව තවත් සීමා කරමින්, සූදු කෙලීම හා එකිනෙකා

රැවටීමේ පාරිශුද්ධ හා දැවැන්ත පද්ධතියක් තුලට ගමන් කරමිනිඃ අනෙක් අතට එය නව නිෂ්පාදන මාදිලියක් දෙසට පරිවර්තනය වීමේ රූපයක් අන්තර්ගත කර ගනියි.”

ඓතිහාසිකව අප සිටින්නේ කොතැනක ද? 2008 වසර ධනේශ්වර වර්ධනයේ චක්‍රයෙහි සන්ධිස්ථානයක් සලකුනු කරන්නේය යන්න ගැන කිසිදු ප්‍රශ්නයක් නැත. මෙය වනාහි කිසියම් වර්ගයක ඉතා ගැඹුරු පසුබෑමක් නොවේ. එය සමස්ත ඓතිහාසික කාල පරිච්ඡේදයක අවසානයයි. ධනේශ්වර නිෂ්පාදන මාදිලියේ ඓතිහාසික බිඳ වැටීමේ අර්ථය වන්නේ, අප යලි වතාවක් යුද්ධයන්ගේ හා විප්ලවයන්ගේ අවධියකට අවතීර්නව සිටින බවයි.

ලෝකය පුරා සියලු වර්ගයේ සමාජ හා දේශපාලන අරගල පැන නැඟීමට නියමිතය. මේ මඟින් අපගේ පක්ෂයට නව අවස්ථාවන් හා අභියෝග මුනගස්වනු ඇත.

එලඹෙන වකවානුවේ අපගේ මූලික කර්තව්‍යය වන්නේ, පසුගිය සියවස පුරා කම්කරු පන්තියේ මූලෝපායික අත්දැකීම් පිලිබඳ ඓතිහාසික පාඩම් මුල්කොට ගෙන, අපේ ව්‍යාපාරය පමනක් හා අපේ ව්‍යාපාරයම පමනක් පෙරට ගෙන ගිය විශ්ලේෂනය මත පදනම්වූ, මාක්ස්වාදී ඉදිරිදර්ශනයක් එම අරගල තුලට හඳුන්වා දීමයි.

**සමාප්තයි.**

© www.wsws.org